රෝගියෙකු මියගිය අවස්ථාවේදී අදාළ දේහය ආදාහනාගාරයට රැගෙන යන අයුරු පෙන්වීම ඔස්සේ මියගිය පුද්ගලයාට යම් අගෞරවයක් සිදුවන බැවින් එම දර්ශන ඉදිරිපත් කිරීමෙන් වළකින ලෙසට කර ඇති ඉල්ලීමක්, කොවිඩ්-19 වාර්තාකරණය සම්බන්ධයෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ඔස්සේ සියලුම මාධ්‍ය වෙත ඉදිරිපත් කර ඇති නිර්දේශ මාලාව තුළ දක්නට ඇත. මෙය රූපවාහිනී මාධ්‍ය සම්බන්ධයෙන් මෙන්ම මුද්‍රිත මාධ්‍ය සම්බන්ධයෙන්ද අදාළ වේ. මෙම නිර්දේශය ඉදිරිපත් වී ඇත්තේ, එවැනි දර්ශන දැක්වීම ඔස්සේ මියගිය පුද්ගලයාට සිදුවිය හැකි යම් අගෞරවයක් වැළැක්වීම අරමුණු කොට ගනිමිනි.

කෙසේ නමුත් පසුගිය දිනක කොවිඩ්-19 වැළඳී මරණයට පත්වූ වෛද්‍යවරයා සම්බන්ධයෙන් සති අන්ත දිවයින හා සිළුමිණ පුවත්පත් තුළ (02/07) පළවූ ලිපි තුළ වෛද්‍යවරයාගේ දේහය ආදාහනාගාරය වෙත රැගෙන යන අයුරුද පෙන්නුම් කර තිබිණි. එසේ නම් මෙය මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් නොවන්නේද?

#MediaEthicsSL #lka #SinhalaPress #Silumina #Sundaydivaina